# නවදිල්ලි බෞද්ධ මධ්‍යස්ථානයේදී මිලින්දට ආශීර්වාද



ඉන්දීය මහ කොමසාරිස් ධුරයෙහි නිල රාජකාරි අරඹන ලද මිලින්ද මොරගොඩ මහතා සිය අක්තපත්‍ර ප්‍රදානය සඳහා අවශ්‍ය ලියකියවිලි ඉන්දීය විදේශ අමාත්‍යාංශයට භාරදීමෙන් පසු නවදිල්ලි බෞද්ධ විහාරස්ථානයට පැමිණ ආශීර්වාද ලබාගත් අවස්ථාව, මන්දිර් මාර්ග් හි පිහිටි මෙම විහාරස්ථානය අනගාරික ධර්මපාලතුමන් ආරම්භ කළ මහාබෝධි සමාගමේ හි එක් සිද්ධස්ථානයකි.

ඉන්දියාව නිදහස ලැබීමටත් පෙර 1931 වසරේදී මහත්මා ගාන්ධිතුමන් විසින් විහාරස්ථානය විවෘත කර ඇති බව සඳහන්ය. ආචාර්ය රාජේන්ද්‍ර ප්‍රසාද්, පණ්ඩිත් ජවහල්ලාල් නේරු, ආචාර්ය එස්. රාධක්‍රිෂ්ණන්, මොරාජි දේශායි, ආචාර්ය බී.ආර්. අම්බෙක්කාර්, ශ්‍රී ලාල් බහුද්රි ශාස්ත්‍රී සහ ඉන්දිරා ගාන්ධි වැනි ඉන්දීය නායකයන් ද ඩඩ්ලි සේනානායක, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, සිරිමාවෝ බණ්ඩාරනායක, ජේ.ආර්. ජයවර්ධන ඇතුළු ශ්‍රී ලාංකික නායකයන් හා ශ්‍රී ලංකාව, ජපානය, කොරියාව හා තායිලන්තය ඇතුළු රටවල තානාපතිවරු හා මහ කොමසාරිස්වරු නවදිල්ලි විහාරස්ථානයට පැමිණ මහ සංඝ රත්නයේ ආශීර්වාද ලබාගෙන ඇති බව පැරැණි ලේඛන දක්වයි. මහාබෝධි සමාගමේ සම ලේකම් විහාරාධිපති රත්මල්වල සුමිත්තානන්ද හිමිපාණෝ අභිනව මහ කොමසාරිස්වරයාට සෙත් පිරිත් සජ්ජායනා කර සෙත් ප්‍රාර්ථනා කළ අතර නියෝජ්‍ය මහ කොමසාරිස් නිලූක කදුරුගමුව, අමාත්‍ය උපදේශක උපුල් පුෂ්පකුමාර යන මහත්වරුද මෙම අවස්ථාවට සහභාගි වූහ.

● පින්තූර - ගාමිණී සරත් ගොඩකන්ද

